ජාතික ප්‍රතිපත්ති,ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

தேசிய கொள்கைகள்,பொருளாதார விவகாரம், மீள்குடியேற்றம் மற்றும் புனர்வாழ்வளிப்பு, வடமாகாண அபிவிருத்தி, தொழிற் பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சு

Ministry of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training&Skills Development and Youth Affairs

“මිලෝදා” පළමු මහළ, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01. ‘மிலோதா’, 1ஆம் மாடி, பிரிஸ்டல் வீதி, கொழும்பு 01.“Miloda” 1st Floor, Bristol Street, Colombo 01.

මගේ අංකය / எனது இல / My No: MNPEA/PLN/Pl/2019 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 10.01.2019

චක්‍රලේඛ අංක MNPEA 02/2019

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියළු රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රජය සතු ව්‍යාපාරවල ප්‍රධානීන්,

**<u>රාජ්‍ය ආයෝජන සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ</u>**

රාජ්‍ය ආයෝජන සැලැස්මට සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඇතුළත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය නැවත සලකා බැලීමට රජයට අවශ්‍යව තිබුණි. ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මධ්‍යකාලීන අයවැය රාමුව තුළ රජයේ ආයෝජන ප්‍රමුඛතා සපුරා ගැනීම සහ ව්‍යාපෘති හඳුනා ගැනීම/ ඉදිරිපත් කිරීම සහ තක්සේරු කිරීමේ ක්‍රියාවලියන් තුළින් වඩාත් අදාළ හා ප්‍රතිඵල මත පදනම්ව ව්‍යාපෘති ආයෝජන සඳහා හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට පියවර ගෙන තිබේ.

එමනිසා මෙම මාර්ගෝපදේශ මගින් රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, සමාගම් හා රජය සතු ව්‍යාපාර සඳහා ඒකාබද්ධ අරමුදල යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති සඳහා ප්‍රායෝගික මගපෙන්වීමක් කිරීමට බලාපොරොත්තු වේ. රජයේ සියළුම නව ව්‍යාපෘති හා මූලික අරමුණු වෙනස් වී ඇති කවරාකාර හෝ වූ රාජ්‍ය ආයෝජන තක්සේරු කිරීමක් හෝ ඒ සම්බන්ධ ව්‍යාපෘති ඇගයීම මෙම මාර්ගෝපදේශයේ අභිප්‍රාය වේ. ඕනෑම රාජ්‍ය සංස්ථාවක්, සමාගමක් හෝ රජය සතු ව්‍යාපාරයක් රාජ්‍ය මුදල්වලින් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන්නේ නම් එම ආයතන ද මෙම මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

දුරකථන / தொலைபேசி / Telephone: 011- 4461500
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2322867, 011-2339732
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: info@mnpea.gov.lk
Website: www.mnpea.gov.lk

මෙම චක්‍රලේඛය හරහා විස්තර කරන මාර්ගෝපදේශ මගින් පහත ක්‍රියාවලීන් උකහා ගත හැකිය.

1. ව්‍යාපෘති ගොඩනැගීමේදී/ සකස් කිරීමේදී
2. ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේදී හා තක්සේරු කිරීමේදී
3. ව්‍යාපෘති නිර්දේශ/ අනුමත කිරීමේ ක්‍රියාවලියේදී

මෙම චක්‍රලේඛයේ විස්තර කර ඇති මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය.

## 1. ව්‍යාපෘති ගොඩනැගීම/ සකස් කිරීම

### 1.1 ව්‍යාපෘති ගොඩනැගීම

අ) එක් එක් අංශවල අවශ්‍යතා අනුව නව ව්‍යාපෘති හා සංකල්ප හඳුනා ගැනීම අදාළ රාජ්‍ය ආයතනවල වගකීම වේ. නව ව්‍යාපෘති මගින් තිරසර ආර්ථික සංවර්ධනයක් හා ජනතාවගේ සමස්ත සුභසාධනය වැඩි දියුණු වන දීර්ඝ කාලයක සිට අදාළ අංශවල තිබූ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය වන පරිදි රජයේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ අද්විතීය සහ නව්‍ය අදහස් ආවරණය කිරීම අරමුණු කර ගත යුතුය.

ආ) රජයේ ආර්ථික හා සමාජයීය අරමුණු මත ව්‍යාපෘතියක යෝග්‍යතාවය හෝ සුදුසු නුසුදුසු බව තීරණය වේ. ජාතික මට්ටමේ ව්‍යාපෘතීන් හුදෙකලාව සකස් නොවිය යුතු අතර, ඒවා පුලුල් ජාතික හෝ ආංශික අරමුණු සාක්ෂාත් කරගතහැකි වෙන් වූ සංරචක විය යුතුය. ව්‍යාපෘති යෝජනාව තුළින් ශුද්ධ ආර්ථික සහ/ හෝ සමාජ ප්‍රතිලාභ පෙන්වා දිය යුතුය. පිරිවැය ප්‍රතිලාභ සහ ව්‍යාපෘතියක් ඇතිව සහ නොමැතිව යන අවස්ථාවන්හීදී ව්‍යාපෘති ප්‍රතිලාභ විග්‍රහයන් යෝජනාව තුළින් පැහැදිලි කළ යුතුය.

ඇ) ව්‍යාපෘති යෝජනාව මූල්‍ය හා ආර්ථික ස්ථායිතාවයක් පවත්වාගෙන යමින් දැනට වඩා ඉහළ ආර්ථික වර්ධනයක් ඇතිකිරීම, රැකියා උත්පාදනය, දරිද්‍රතාවය දුරලීම, ජීවන මට්ටම ඉහළ නැංවීම, සාධාරණ ලෙස ආදායම් බෙදීයාමකට ඉඩ දෙන, විදේශ විනිමය ඉතුරුවන සහ අපනයන වර්ධනය කරන එකක් බවට සාධාරණීයකරණය කිරීමක් සිදුවිය යුතු අතර පුද්ගලික අංශයේ පවතින ක්‍රියාකාරිත්වයන්ට බාධා නොවන සහ මූල්‍යමය සහ ආර්ථිකමය ස්ථාවරත්වය ආරක්ෂා කරන ව්‍යාපෘති යෝජනාවක් විය යුතුය.

ඈ) අවම වියදමකින් සහ ගැටළු සඳහා ආමන්ත්‍රණය කළ හැකි හොඳම ශක්‍යතාවයක් ඇති විසඳුම ව්‍යාපෘතිය තුළින් සලකා බැලිය යුතුය. රජයේ සියළුම ආයෝජන පවතින තත්වයට වඩාත් හොඳ

අනාගතයක් අරමුණු කරගනිමින් සකස් කළ යුතුය. කෙසේ වුවද, සීමිත සම්පත් ප්‍රමාණයක් තුළ ආයෝජන ප්‍රමුඛතා පෙළගැස්වීමේ අවශ්‍යතාවය දැඩි වනු ඇත.

ඉ) හඳුනාගත් ව්‍යාපෘති, ආර්ථික, සමාජ හා පාරිසරික තක්සේරුවන් සහ තාක්ෂණික අභිප්‍රායයන් එළිදක්වමින්, මතුවිය හැකි අවදානම් සැලකිල්ලට ගනිමින් ඕනෑම සාධකයන් මත ක්‍රියාත්මක කිරීමට ශක්‍යතාවයක් ඇති ව්‍යාපෘතියක් බව සහතික කිරීම අත්‍යාවශ්‍යය. ඉහත අභිප්‍රායයන් සැලකීමේදී අවදානම් කළමනාකරණය හා අවම කර ගැනීම සඳහා අවශ්‍යය උපක්‍රම ඉදිරිපත් කළයුතුය.

ඊ) ඒ අනුව, ව්‍යාපෘති යෝජනා කළමනාකරණයේදී කාලරාමු, යථායෝගී බව සහ තොරතුරු කළමනාකරණයේ දී අවංකභාවය ප්‍රදර්ශණය හඳුනා ගැනීම අවශ්‍ය වේ. ආංශිකව, අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල සහ අංශ අතර අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු අතර ක්‍රියාකාරකම්වල ද්විකරණයකවීම් වළක්වා ගත යුතු වේ.

එ) ව්‍යාපෘතියේ තිරසරබව රැකගැනීම සඳහා අනාගත මෙහෙයුම් හා නඩත්තු වැඩපිළිවෙල පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය.

1.2 ව්‍යාපෘති වර්ගීකරණය

ව්‍යාපෘතියක මුළු වියදම මත පදනම්ව මහා (Mega), විශාල (Large ) , මධ්‍යම (Medium ), කුඩා (Small )සහ ක්ෂුද්‍ර (Micro ) ලෙස පහත සඳහන් පරිදි වර්ග කල හැකිය.

| ව්‍යාපෘති වර්ගය | මුළු වියදම (රු. මිලියන ) |
|---|---|
| මහා (Mega) | 10,000 ට වැඩි |
| විශාල (Large ) | 1,000 -10,000 |
| මධ්‍යම (Medium ) | 100 -1000 |
| කුඩා (Small ) | 10 -100 |
| ක්ෂුද්‍ර (Micro ) | 10 ට අඩු |

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියෙන් ක්ෂුද්‍ර ව්‍යාපෘති ක්‍රියාත්මක කල හැකිය. මෙහිදී, ව්‍යාපෘතිය අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම හෝ වෙන්වූ කොටස් ලෙස හෝ කුඩා කොටස් ලෙස වෙන්කර හෝ ක්‍රියාත්මක කිරීම අනුමත නොකෙරේ. තවද, ව්‍යාපෘතීන් අමාත්‍යාංශයේ සැලසුම් අංශය මගින් ඇගයීම කලයුතු අතර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව අමාත්‍යාංශ ලේකම්ගේ ලිඛිත අනුමැතිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දිය යුතුය.
මහා, විශාල, මධ්‍යම සහ කුඩා ව්‍යාපෘති පහත දැක්වෙන පරිදි ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ හා ඇගයීමේ ක්‍රියාවලිය අනුගමනය කල යුතුය. කෙසේ වුවද කුඩා ව්‍යාපෘති සඳහා පමණක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැති අවසාන අනුමැතිය ලෙස සැලකේ. එහෙත් ඇතැම් කුඩා ව්‍යාපෘති යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු යැයි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව අදහස් කරන්නේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව ඒ අනුව ක්‍රියාකරනු ඇත.

2. ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීම හා ඇගයීම

- ව්‍යාපෘති පිළියෙළ කිරීමෙන් පසු අමාත්‍යාංශ ලේකම්/ ප්‍රධාන ලේකම් හරහා ඔහුගේ/ ඇයගේ සම්මුතිය හා නිර්දේශ මත ඇගයීම් කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා අදාල රේඛීය අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කළ යුතුය.

- ව්‍යාපෘති යෝජනාවන් ලැබීමෙන් පසුව අදියර දෙකක ඇගයීමේ ක්‍රමය මත ඇගයීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි.

2.1 මූලික ඇගයීම

ව්‍යාපෘති සංකල්පය, ඇමිණුම 1- ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය හා කාර්යසංග්‍රහය, www.mnpea.gov.lk/ www.npd.gov.lk යටතේ ඉදිරිපත්කර ඇති ආකෘතිය ප්‍රයෝජනයට ගනිමින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

සවිස්තරාත්මක අධ්‍යයන/ පූර්ව ශක්‍යතා අධ්‍යයන වැනි වාර්තා මෙම අදියරේදී ඉදිරිපත් කිරීම ඇගයීම් ක්‍රියාවලිය සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර සති දෙකක් ඇතුලත ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ඇගයීම් කටයුතු ආරම්භ කරනු ඇත. අත්‍යවශ්‍ය තොරතුරු හෝ දත්ත ව්‍යාපෘති වාර්තාවෙහි අඩංගු නොමැති නම් අදාල අතිරේක තොරතුරු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, යෝජනාව ඉදිරිපත් කළ අමාත්‍යාංශයෙන් විමසනු ඇත. ව්‍යාපෘතිය පිළිගන්නේ නම්, ව්‍යාපෘතියේ සංකීර්ණත්වය සහ ප්‍රමාණය අනුව ව්‍යාපෘතිය ඉදිපත් කළ ආයතනය විසින් ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුද යන්න හෝ වැඩිදුර විමර්ශනයක් කිරීම අවශ්‍යද යන්න ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් දන්වනු ඇත.

මූලික ඇගයීම් අදියරේදී ඇගයීම් කිරීම සඳහා භාවිතා කරනු ලබන මූලික නිර්නායක වන්නේ;

අ ) ව්යාපෘතිය සකස් කර ඇත්තේ රජයේ අරමුණුවලට සහ ජාතික සහ ආංශික ප්‍රතිපත්ති වලට අනුකූලවද යන්න

ආ)විස්තරාත්මකව ගණනය කළ හැකි ව්‍යාපෘතීන්ගේ තිරසාර භාවය සමඟ පිරිවැය හා ප්‍රතිලාභ ගණනය කිරීම

2.2 විස්තරාත්මක ඇගයීම

දෙවැනි අදියරේදී සම්පූර්ණ ශක්‍යතා අධ්‍යනය සහිතව සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව ලැබුණු පසු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සවිස්තරාත්මකව ඇගයීම කරනු ඇත. පිළිගත් නිර්ණායක වලට අනුව ව්‍යාපෘතියේ යෝග්‍යතාවය හා පිළිගැනීම, ව්‍යාපෘතිය අරමුදල් සඳහා නිර්දේශ කිරීමට පෙර ඇති අවසාන ඇගයීම ලෙස පිළිගෙන ඇත. මෙම අවස්ථාවේදී ශක්‍යතා අධ්‍යනය මගින්, විද්‍යාත්මක ක්‍රම භාවිතා කරමින් අරමුණු උචිත ලෙස ඉතිරිව පවතීද යන්න, වියදම කළමනාකරණය කළ හැකි සීමාවේ පවතීද යන්න, ව්‍යාපෘතිය තාක්ෂණික වශයෙන්, ආර්ථික වශයෙන්, සමාජීය හා පාරිසරික වශයෙන් ඉහළ ශක්‍යතාවයක් ඇත්ද යන්න හා අවදානම් අවම කිරීම සඳහා වැඩපිළිවෙලක් හඳුනාගෙන තිබේද යන කරුණු තුලින් ඇගයීම් කරනු ඇත.

3. ව්‍යාපෘතිය සඳහා නිර්දේශ/ අනුමැතිය ලබා දීම

මූලික හා අවසාන ලෙස අදියර දෙකකින් සමන්විත ඇගයීම් ක්‍රමය මහා, විශාල හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපෘති සඳහා උපයෝගී කරගනු ලැබේ.

3.1 මූලික ඇගයීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් මූලික ඇගයීම් සිදුකල පසු විදේශ අරමුදල් සම්පාදනය සඳහා අදාල රේඛිය අමාත්‍යාංශයට පිටපතක් සහිතව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හෝ දේශීය අරමුදල් සම්පාදනයට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

මෙම අදියර සම්පූර්ණ වූ පසු, අමාත්‍ය මණ්ඩලයේ මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශයද සහිතව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපෘති සංකල්පය සඳහා මූලික අනුමැතිය ලබා ගැනීමෙන් පසු, සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක්/ ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කරනු ඇත.

සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව තුලින් ව්‍යාපෘතියේ සම්පූර්ණ විෂයපථය, වියදම් විස්තරය සහ මූල්‍ය, සමාජීය, තාක්ෂණික අවධානම සහ පාරිසරික තක්සේරුව ආවරණය කරනු ඇත. විදේශ අරමුදල් අපේක්ෂා කරන්නේ නම්, ව්‍යාපෘතියේ ස්වභාවය අනුව වඩාත් සුදුසු විදේශ මූල්‍ය ආයතනයක් සම්බන්ධව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කිරීම සිදු කරනු ඇත.

පහත සඳහන් නිර්දේශයන්ට අනුව මූල්‍ය ප්‍රභවය තීරණය කරනු ඇත;

අ) ආංශික මූල්‍ය සීමාවට යටත්ව කුමන ව්‍යාපෘති යෝජනා දේශීය අරමුදල් සඳහා යොමුකරන්නේද?

ආ) විදේශ මූල්‍යනය සහ සාකච්ඡා සඳහා කුමන ව්‍යාපෘති යොමුකරන්නේද යන්න

ඇ ) රාජ්‍ය- පෞද්ගලික ඒකාබද්ධ ආයෝජන සඳහා කුමන ව්‍යාපෘති ඉදිරිපත් කළ යුතුද යන්න

ඈ) දේශීය බැංකු මඟින් මූල්‍යනය කර ගැනීම සඳහා කුමන ව්‍යාපෘති ඉදිරිපත් කරන්නේද යන්න

ඉ ) දැනට පවතින සම්පත් වල සීමාව හේතුවෙන්, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ව්‍යාපෘති කවරේද යන්න

3.2 අවසාන අනුමැතිය

ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීමට අවශ්‍ය වූ ව්‍යාපෘතියට අදාල සම්පූර්ණ විෂය පථය හෝ සංශෝධන සහිත ව්‍යාපෘතිය යෝජිත මූල්‍යනය සිදුකරන ආකාරය සමඟින් අනුමත කිරීම මෙම අදියරේදී සිදු කරයි. මෙහිදී ශක්‍යතා අධ්‍යයනය වාර්තාව ඇගයීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලද පසු අදාල රේඛීය අමාත්‍යාංශය විසින් ඒ සඳහා අවසාන අනුමැතිය ලබාගැනීමට අමාත්‍යමණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට විදේශ මූල්‍යනය සඳහා අදාල ආධාර ආයතනය සමඟ අවසාන සාකච්ඡා (negotiations) ආරම්භ කළ හැකිය.

ව්‍යාපෘතිය සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු එය අයවැය ඇස්තමේන්තුවලට ඇතුලත් කළ හැකිය. අයවැය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා නියමිත කාලය තුලදී අදාල රේඛීය අමාත්‍යාංශය විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අනුමත ව්‍යාපෘතිය ඉදිරිපත් කළ යුතුය.

4. ශක්‍යතා අධ්‍යයනය

ඇතැම්විට ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම සඳහා බාහිර (විදේශාධාර ආයතන) සහාය අපේක්ෂා කළ හැකිය. කෙසේවෙතත් එවැනි අවස්ථාවල දී අදාල රාජ්‍ය ආයතනයේ මැදිහත්වීම හා ශක්‍යතා අධ්‍යයනයේ හිමිකම අයත්වන පරිදි එය සිදුකිරීමට අත්‍යාවශ්‍ය වේ. පූර්ව හෝ සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් අවශ්‍ය නොවන ව්‍යාපෘති අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසු ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඍජුව ඉදිරිපත් කළ හැකිය.

5. ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

පහත සඳහන් අදියර තුන යටතේ ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම නව්‍යකරණය කිරීමට ද යෝජනා කෙරේ.

- රේඛීය අමාත්‍යාංශවල ව්‍යාපෘති පෙළගැස්ම පදනම්කරගෙන අදාල අමාත්‍යාංශයෙන් විමසා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට මගින් ආංශික ව්‍යාපෘති පෙළගැස්ම සකස් කිරීම.

- සකස්කළ ව්‍යාපෘති පෙළගැස්ම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට මඟින් රාජ්‍ය ආයෝජන සැලැස්මට ඇතුළත් කිරීම හා සංශෝධිත රාජ්‍ය ආයෝජන සැලැස්ම සෑම වර්ෂයකම ජූලි මස 31 දිනට ප්‍රකාශයට පත් කිරීම.

- යෝජිත රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත මඟින් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති රාජ්‍ය ආයෝජන කමිටුව විසින් රාජ්‍ය ආයෝජන සැලැස්මට ඇතුළත් කර ඇති ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කරනු ලැබේ. අදාල පනත ක්‍රියාත්මක වනතුරු (enacted) අනෙකුත් සම්බන්ධිත ආයතන හා සමඟ එක්ව ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම සිදුකරනු ඇත.

6. විදේශ මූල්‍යයනය

නිල සංවර්ධන සහයෝගිතාවය (Official Development Assistance) රජයේ ආයෝජන සැලසුම්වලදී සැලකිය යුතු කාර්යභාරයක් අඛණ්ඩව සිදුකරනු ලබයි. රේඛීය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති යෝජනා ප්‍රමාණයේ සිදුව ඇති වර්ධනයත් සමඟ මෑතකාලීනව විදේශ මූල්‍යනය සඳහාවන ඉල්ලුමද සැලකියයුතු ලෙස ඉහළගොස් ඇත. එසේවුවද, විදේශ මූල්‍යනය සඳහා පවතින නීතිමය හා ආයතනික සීමාවන් ජාතික අයවැය සඳහා ඇතුලත් කරගත හැකි සීමාවන් මෙන්ම රජය මේ වනවිට බැඳීම් සිදුකරගෙන ඇති ණය ආපසුගෙවීම් ස්ථාවරව පවත්වාගෙන යා යුතු වීම වැනි කරුණු හේතුවෙන් කෙටිකාලීනව ඉල්ලුමට සමානව විදේශ ණය ලබාගැනීම සීමාව ඉහළ නැංවීමට අපහසු වී තිබේ. එබැවින් රේඛීය අමාත්‍යාංශ විදේශ මූල්‍යනය වඩාත් සුදුසු ව්‍යාපෘති විදේශ මූල්‍යනය සඳහා ඉදිරිපත් කර ද්වීකරණයක් වීම වැලැක්වීම සඳහාත් අවශ්‍ය පියවර ගත යුතුවේ.

6.1 ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලවන සේ ව්‍යාපෘති විෂයපථයන් හා ව්‍යාපෘති සකස්කිරීමේ ප්‍රවනතාවය තීරණය කිරීම රේඛීය අමාත්‍යාංශ/ආයතන වෙත හිමිවූ කාර්යයක් වන අතර, විශේෂිත අවශ්‍යතා මත සකස්කරනු ලබන ව්‍යාපෘති සංකල්ප සඳහා යෝජිත පිලිගැනීම් ලද පසු පිටපත් මෙම ක්‍රියාවලියට ආධාර ආයතනවලට සම්බන්ධ වය හැකිය. එමනිසා සලකාබලනු ලබන ව්‍යාපෘතිය

ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලැබීමකින් තොරව රාජ්‍ය ආයතන විදේශ මූල්‍යනය සඳහා සංවර්ධන ව්‍යාපෘති පිළියෙල කිරීමට ආධාර ආයතන සමඟ සෘජුව සම්බන්ධ නොවිය යුතුය.

6.2 සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සඳහා වන බලපෑම, විදේශ ණය සඳහා වන වියදම, විදේශ ණය හා ආධාර කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම, ණය ලබාදෙන ආයතනයේ කොන්දේසි (මූල්‍යමය හා මූල්‍යමය නොවන), අදාල ක්‍රියාපටිපාටි, අදාල ණය දෙන ආයතනයේ තාක්ෂණික නිපුණතාවය, බැදීම් සහ ආපසුගෙවීම් හැකියාව සහ ව්‍යාපෘතියේ තිරසාරත්වය යන කරුණු සලකා විදේශ මූල්‍යනය වෙනුවට ඇති රාජ්‍ය පෞද්ගලික සහයෝගිතාවය මත මූල්‍යනය සිදුකිරීම වැනි අනෙකුත් ආකාරයන් (modality) සැලකිල්ලට ගැනීම වැනි කරුණු පිළිබඳව දැඩි අවධානයක් යොමු නොකර රේඛීය අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන අපනයන ණය දෙන ආයතන (Export Credit Agencies) ඇතුළුව සංවර්ධන සහයෝගිතා පාර්ශවකරුවන් වෙතින් මූල්‍යයනය සිදුකරගැනීම උදෙසා ව්‍යාපෘති පිළියෙල කරනු ලබන බව නිරීක්ෂනය වී ඇත. මෙම භාවිතය, රජයේ විදේශ මූල්‍යනය උපායමාර්ග සහ අයවැය ක්‍රියාවලිය දුර්වල කිරීමටත්, දීර්ඝකාලීනව එවැනි ව්‍යාපෘතිවල තිරසාරභාවය පිළිබඳව ගැටළු ඇතිවීමටත් බලපා ඇත.

6.3 රජයේ විදේශ මූල්‍යනය උපායමාර්ග ලෙස හඳුනාගෙන ඇත්තේ විදේශ මූල්‍යනතුලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති මඟින් අනාගතයේදී බදු ආදායම ඉහළ නංවන සහ වෙනත් ආදායම් මාර්ග ඇතිකරමින් ණය ආපසු ගෙවීම් කිරීමට සහායවන අයුරින් ආර්ථික ක්‍රියාකාරකම් හා වත්කම් ඒකරාශීවන වැඩපිලිවෙලක් ඇතිවිය යුතු බවයි.

6.4 විදේශ මූල්‍යනය ගනුදෙනු සඳහා වන ඉහළ වියදම, විශාල ලෙස අවිධිමත් කුඩා ව්‍යාපෘති රසක් කළමනාකරණය කිරීමේදී ඇතිවන සංකීර්ණතා, විදේශ විශේෂඥයන්ගේ සේවය සඳහා සැලකිය යුතු වියදමක් දැරිය යුතු වීම, විදේශ ධූත කණ්ඩායම් විශාල ප්‍රමාණයක් පැමිණීම හා ආධාර ආයතන මඟින්ම ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක වීම වැනි හේතු නිසා කුඩා ව්‍යාපෘති සඳහා වන විදේශ මූල්‍යනය අධෛර්යමත් කරනු ලැබේ.

6.5 විදේශ මූල්‍යයන මූලාශ්‍රය තීරණය කිරීමේදී, විවිධ ආර්ථික අංශ වලදී සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා විවිධ ණය දෙන ආයතනවල ඇති වාසිදායක තත්වයන්, හොඳින් ඇගයීමකට ලක් කෙරේ. ණය ගැනීම සඳහා වන පිරිවැය, පසුගිය අත්දැකීම් ක්‍රියාපිලිවෙල සහ ක්‍රියාපටිපාටි, කොන්දේසි අදාළ ණය දෙන ආයතනයන්ගේ තාක්ෂණික ප්‍රවීනත්වය ආදී ප්‍රධාන අංගයන් සැලකිල්ලට ගනු ලැබේ. රජය සහ අදාළ ණය දෙන ආයතන වල වාර්ෂික උපදේශන ක්‍රියාවලිය තුළදී අනුමත සංවර්ධන ව්‍යාපෘති යෝජනා අදාළ ණය දෙන ආයතනවල ව්‍යාපෘති පෙළගැස්මට (Pipeline) ඇතුලත් කිරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලැබේ. එක් සංවර්ධන පාර්ශවකරුවෙකුගේ මධ්‍යකාලින ව්‍යාපෘති පෙළගැස්මට ඇතුලත් කිරීමට හඳුනාගත් ව්‍යාපෘතීන් සඳහා තවත් සංවර්ධන පාර්ශවකරුවෙකු වෙතින් විදේශ මූල්‍යනය සඳහා ඉල්ලීම් නොකළ යුතුය. ණය ගිවිසගැනීමේ සාකච්ඡා වල (Aid Negotiations) ප්‍රතිඵලයන් ලෙස මූලික ව්‍යාපෘති සැලසුමේ සැලකිය යුතු වෙනස්කම් සිදුවීම මත ව්‍යාපෘතියේ පිරිවැයට හෝ ප්‍රතිලාභවල සැලකියයුතු වෙනස්කම් සිදුවන්නේ නම් අදාළ වෙනස්කම් ව්‍යාපෘතියට ඇතුලත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.

6.6 සිය කැමැත්තෙන් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා (Unsolicited Project Proposals) ඒ වෙනුවෙන් නිකුත් කරණු ලබන ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. මාධ්‍ය කාලීන අයවැය රාමුවක් යටතේ සකස් කරණු ලබන ජාතික අයවැය ක්‍රියාවලිය තුල, මධ්‍ය කාලීන රාමුව තුල පවත්නා සම්පත් (ප්‍රතිපාදන) සැලකිල්ලට ගනිමින්, රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට තම සංවර්ධන ව්‍යාපෘති යෝජනා සැලසුම් කිරීමට වැඩි නම්‍යතාවක් ලබා දී තිබේ.

අ/ කලේ වී. සිවඥානසෝති
ලේකම්

පිටපත්:
01 ජනාධිපති ලේකම්

02 අගමැති ලේකම්
03 අමාත්‍යමණ්ඩල ලේකම්
04 විගණකාධිපති
05 සභාපති, මුදල් කොමිෂන් සභාව
06 අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
07 අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
08 අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

මෙම චක්‍රලේඛය 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ. මෙම චක්‍රලේඛය සම්බන්ධව මූලික ලේඛනය වන්නේ ලේකම් වරයා අත්සන් කළ ඉංග්‍රීසි පිටපතයි. ඔබේ පහසුව සඳහා මෙය සිංහල භාෂාවට පරිවර්ථනය කර ඇත. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කරගැනීම් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විමසන්න.
(දුරකථන 0112484612/ 0112484576 හෝ විද්‍යුත් තැපැල: dgnp@npd.treasury.gov.lk )